## 2018 පෙබරවාරි 06 -තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව විසින් කරන ලද නිවේදනය

පසුගිය වසර තුල 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීමේදී, සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහල ගොස් ඇති කොමිෂන් සභාව ඉදිරියේ ගොනු කරන ලද අභියාචනා සංඛ්‍යාව සහ ප්‍රධාන පොදු අධිකාරීන් විශාල සංඛ්‍යාවක් අතර පනත සම්බන්ධයෙන් ඇතිවී ඇති ධනාත්මක අවබෝධය පිලිබඳ ශ්‍රී ලංකාවේ පළමු තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වාර්තා කරයි.

පසු ගිය මාසය තුළදී පමණක් නිකුත් කළ තොරතුරු අතර යුද්ධ හමුදාධිපති සකස්කළ නිගමන සහ ලිංගික අතවරයක් සම්බන්ධව ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරියෙකුට එරෙහිව පවත්වනු ලැබූ පරීක්ෂණයකට අදාළ වෙනත් ලිපිලේඛන, ඉඩම් අත්පත් කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වැනි රජයේ ආයතන විසින් නිකුත් කරන ලද අත්පත් කිරීමේ සහතික, පුනරුත්ථාපනය කරන ලද එල්.ටී.ටී.ඊ. සංවිධානයේ හිටපු සටන්කරුවන් අදාලව වයස, දිස්ත්‍රික්කය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව වර්ගීකරණය කළ සංඛ්‍යානම දත්ත, පළාත් පාලන ආයතන විසින් අවිධිමත් ගොඩනැගිලි සඳහා නිකුත් කරන ලද අනුමැතියන් සහ රාජ්‍ය ආයතන තුල උසස් වීම් සිදු කරනු ලබන පටිපාටියන් සම්බන්ධ තොරතුරුද විශේෂයෙන් ඇතුළත් වේ.

මෙම ගතවී යන සතිය තුල, සංක්‍රමණික සේවකයන් සම්බන්ධ ශ්‍රී ලංකා රජය සහ කටාර්, කුවේට් සහ සෞදි අරාබි රාජ්‍යන් අතර පවතිනු ලබන අවබෝධතා ගිවිසුම් සහ ද්විපාර්ශ්වික ගිවිසුම් එම රටවල රැකියාවෙහි නිරත වන ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරැකීම උදෙසා ඇති මහජන සුභ සිද්ධිය සැළකිල්ලට ගෙන නිකුත් කරන මෙන් කොමිෂන් සභාව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත නියෝග කරන ලදී.

ධනාත්මක දියුණුවන් බොහොමයක් තිබුනද, ඇතැම් පොදු අධිකාරීන් මෙතෙක් තොරතුරු නිලධාරීන් සහ/හෝ නම්කළ නිලධාරීන් පත්කොට හෝ ඇතැම් අවස්ථාවලදී පනතේ 26 වගන්තිය යටතේ අනිවාර්ය පරිදි එම නිලධාරීන්ගේ නම් ප්‍රසිද්ධ කරහෝ නොමැත. අනෙකුත් අවස්ථාවලදී පොදු අධිකාරීන් විසින් නීත්‍යානුකූලව ලබා දිය යුතු තොරතුරු සැපයීම සඳහා වරින් වර කල් ඉල්ලීම මගින් තොරතුරු ලබා දීම පැහැර හරිනු ලබයි. මෙසේ පැහැර හැරීම් සිදුකරන පොදු අධිකාරීන් අතරට ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාදාමය තුල තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සම්බන්ධයෙන් දැනුම සහ ප්‍රජා සහභාගිත්වය ප්‍රවර්ධනය කළ යුතු ආයතනද ඇතුළත් වීම කණගාටු විය යුතු කරුණකි.

තොරතුරු නිලධාරීන් හා නම්කළ නිලධාරීන් පත්කිරීම සම්බන්ධයෙන් ඇති ව්‍යාකූලභාවය සහ පනතේ කාල සීමාවන්ට අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් පනත ක්‍රියාත්මක කිරීමෙන් පසු පළමු මාස කිහිපය තුළ නම්‍යශීලී විය හැකි වුවද, එම කාල සීමාව මේ වන විට අවසන්වී බොහෝ කාලයක් ගතවී ඇත. පනත යටතේ කොමිෂන් සභාව වෙත ලබාදී ඇති නඩු පැවරීමට ඇති බලතල විරලව භාවිතා කළද, පොදු අධිකාරීන් විසින් දිගින්

දිගටම සිදු කරන මග හැරීම් සම්බන්දව, පාර්ලිමේන්තුවට යවන වාර්තාවන්හි එම පොදු අධිකාරීන් නම් කර ප්‍රසිද්ධ කිරීම වැනි නිසි ප්‍රතිචාර දැක්වීමට සිදු වේ.

2017 ඔක්තෝබර් මස වන විට කොමිෂන් සභාව විසින් පොදු අධිකාරීන් හා පුරවැසියන් අතර සිදුවූ අභියාචනා 37 ක සම්පූර්ණ විභාග කිරීම් වලට අදාළ තොරතුරු නිකුත් කර ඇති අතර, අඩුපාඩු නොමැති අභියාචනා 220කට ආසන්න සංඛ්‍යාවක් කොමිෂන් සභාව වෙත ලැබී ඇත. පනතෙහි සඳහන් වී ඇති පරිදි තොරතුරු නිලධාරියාගෙන් පසුව නම්කළ නිලධාරියා වෙත අභියාචනයක් යොමුකිරීම වෙනුවට, කෙලින්ම කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කිරීම ඇතුළු විවිධ අඩුපාඩු හේතුකොටගෙන අභියාචකයන් 218කගේ අභියාචනා නිවැරදි කිරීමට යොමු කර ඇත.

2018 පෙබරවාරි 03 වන විට කොමිෂන් සභාව වෙත සම්පූර්ණ අභියාචනා 411 ක් ලැබී ඇති අතර, අවසන් කරන ලද/ විභාග කරමින් පවතින / කොමිෂන් සභාව ඉදිරියේ ලැයිස්තුගත කර ඇති අභියාචනා දළ වශයෙන් ගත් කළ 350ක් පමණ වේ.අභියාචනා බහුතරයකගේ (අභියාචනා 81ක්) තොරතුරු හෙළිදරව් කර ඇති අතර පීඩාකාරී අභියාචකයන්ගේ අභියාචනා කිහිපයක්ම නිෂ්ප්‍රභා කොට ඇත. තවද, අසම්පූර්ණ අභියාචනා ප්‍රමාණයේ අඩුවීම පුරවැසියන් අභියාචනා ක්‍රියාපටිපාටියට හුරුපුරුදු වීමේ ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකිය.

කොමිෂන් සභාවේ සියලු නියෝග එහි ත්‍රිභාෂා වෙබ් අඩවියේ http://rticommission.lk දැක ගත හැකිය. තොරතුරු හෙළිදරව් කිරීමට අදාළ විස්තරාත්මක හේතු ප්‍රසිද්ධියට පත් කර ඇත. කොමිෂන් සභාව මෙය වැදගත් ක්‍රියාවක් සේ සලකනු ලබන්නේ පනතෙහි ඇති මහජන සුභසිද්ධියට පාදකවූ උපරිම තොරතුරු අනාවරණය කිරීමේ මූලධර්මය සහ පෞද්ගලිකත්වයට අදාළ කරුණු ඇතුළු පනත යටතේ නිශ්චිතව සඳහන් කර ඇති තොරතුරු වලට ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා අතර තුලනයක් ගොඩ නගා ගැනීම පිළිබඳව අවබෝධයක් පොදු අධිකාරීන්ට මෙන්ම මහජනයාටද ලබා දීම සඳහාය.

කොමිෂන් සභාව ඉදිරියේ ඇති අභියාචනා අතරින් බොහොමයක් රජයේ දුර්පරිපාලනය සම්බන්ධව වන අතර, සැලකිය යුතු ප්‍රතිශතයක් ප්‍රසම්පාදන කටයුතු, මහජන මුදල් නාස්තිය, අකාර්යක්ෂම සේවා සැපයුම් සහ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාළ වේ. අභියාචනා වලින් හතරෙන් එකක් පොදු අධිකරින්හි මානව සම්පත් සම්බන්ධ ගැටළු එනම් විභාග පැවැත්වීමේදී විනිවිධබාවයක් නොමැති වීම සහ උසස්වීම් ලබාදීම් සම්බන්ධයෙන් වූ අතර අනෙක් බහුලව ලැබුණු අභියාචනා වර්ගය ඉඩම් හා දේපල සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් වේ. මීට අමතරව අභියාචනා වැඩි සංඛ්‍යාවක් වාර්තාවූයේ පාසැල්වලට ළමුන් ඇතුළත් කිරීම සහ පාසැල් පරිපාලනය සම්බන්ධවයි.

පනත යටතේ කොමිෂන් සභාව වෙත තොරතුරු සැපයීමේ ක්‍රියාවලියට අදාළව උපදෙස් ලබාදිය හැකි වුවද කොමිෂන් සභාව වෙත කළ හැකි අභියාචනයකට අදාළ තොරතුරු ඉල්ලීමක හරයානු කරුණු පිළිබඳව කොමිෂන් සභාවට උපදෙස් ලබා දිය නොහැකිය. තොරතුරු ලබාගත හැකි සහ ලබාදිය හැකි ක්‍රියාවලිය පිළිබඳව උපදෙස් තකා කරන ඉල්ලීම් වැඩිමනක් පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා රාජ්‍ය ව්‍යවසායන් විසින් සිදු

කරනු ලබයි. 2018 දී කොමිෂන් සභාව පනතේ 16 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද ස්වාධීන අරමුදල ලබා ගත් බැවින්, තොරතුරු ලබා දීම සඳහා පනත යටතේ බැඳී සිටින ආයතන සමඟ මහජන සම්බන්ධතා වර්ධනය කිරීමේ වැඩිදුරටත් නිරත විය හැකිය.

තවද පොදු අධිකාරීන් විසින් පනතේ සඳහන් කර ඇති පරිදි තම වාර්ෂික වාර්තාද කොමිෂන් සභාව වෙත ලැබීමට සැලැස්වීම සාධාණීය කරුණකි.

ඉදිරි මාස කිහිපය තුලදී පනතේ 8 හා 9 වගන්ති ප්‍රකාරව අයවැය, රාජ්‍ය සේවා, වියදම්, ප්‍රසම්පාදන ක්‍රියාවලිය සහ නිශ්චිත ඉල්ලීම් වලට අදාලව පූර්ව අනාවරණය කිරීම් http://rticommission.lk/ වෙබ් අඩවියේ ඇති කොමිෂන් සභාවේ මාර්ගෝපදේශවලට අනුව ප්‍රගාමීව හෙළිදරව් කිරීම සිදු විය යුතුයි.